විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

කොමිෂන් සභා චක්‍රලේඛ අංක : 04/2018

අංක 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

2018 ජුනි මස 28 වන දින

විශ්වවිද්‍යාල උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

<u>උපකුලපති තනතුරට පත්කිරීම</u>

උක්ත කරුණ සම්බන්ධයෙන් 2016.09.28 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 14/2016 වෙත ඔබගේ අවධානය යොමු කරවමි.

2. උපකුලපති තනතුරට පත් කිරීමේ අරමුණ වෙනුවෙන් නම් තුනක මණ්ඩලයක් නිර්දේශ කිරීමට අනුගමනය කරන ලද කාර්ය පටිපාටිය සළකා බැලූ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, දැනට පවත්නා ප්‍රතිපාදනවලට තවදුරටත් සංශෝධන ඉදිරිපත් කිරීමට 2018.05.10 දින පැවති සිය 986 වැනි සභා වාරයේ දී තීරණය කරන ලදි.

3. ඒ අනුව, පහත දක්වා ඇති සංශෝධිත කාර්ය පටිපාටිය අනුගමනය කරන මෙන් විශ්වවිද්‍යාල වෙත දැනුම් දෙනු ලැබේ;

I. විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරී (පාලක සභාවේ ලේකම්) විසින් පුවත්පත්වල පළ කරන ලද දැන්වීමක් මඟින් තනතුර සඳහා අයදුම්පත්/නාමයෝජනා කැඳවිය යුතු වන්නේය. අයදුම්කරුවන්/නම් කරන තැනැත්තන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය. වත්මන් උපකුලපතිවරයාගේ ධුර කාලය අවසන් වීමට මාස 6 ක කාල පරිච්ඡේදයකට පෙර පවතින මාසය ඇතුළත ලේඛකාධිකාරී විසින් පුරප්පාඩුව ප්‍රචාරය කරමින් දැන්වීමක් පළ කළ යුතුය.

II. අයදුම් කිරීමට විශිෂ්ඨ පුද්ගලයන් සෙවීම සහ ඔවුන් පෙළඹවීම සඳහා මහාචාර්ය තනතුර හෝ ඉහළ ධූරයක් දරන ජ්‍යෙෂ්ඨ අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් (03) සමන්විත සුදුසු සෙවීම් කමිටුවක් විශ්වවිද්‍යාල පාලක සභාව විසින් පත් කළ යුතු වන්නේය. සෙවීම් කමිටුවේ සාමාජිකයන්ගෙන් අවම වශයෙන් එක් අයෙකු හෝ විශ්වවිද්‍යාලයේ පීඨාධිපතිවරයෙක් විය යුතු අතර එම පුද්ගලයා කමිටුවේ සභාපතිවරයා විය යුතුය.

III. විශ්වවිද්‍යාලයේ උපකුලපති ධූරයට පත්කළ හොත් ඔහු/ඇය විසින් සාක්ෂාත් කර ගැනීමට යෝජනා කරන්නේ කුමක් ද, විශ්වවිද්‍යාලයේ සංවර්ධනය සඳහා ඉදිරිපත් කරන දැක්ම පිළිබඳ ප්‍රකාශනයක් සහ අයදුම්කරුගේ උපන් දිනය ද ඇතුළත් සම්පූර්ණ ජීව දත්ත විස්තරයක් අයදුම්කරු/නාමිකයා විසින් ඉදිරිපත් කළ යුතුය.

IV. වත්මන් උපකුලපතිවරයා අයදුම්කරුවෙකු වන අවස්ථාවක දී, ඉහත iii ඡේදයේ දක්වා ඇති ලේඛනවලට අමතරව, ඔහුගේ/ඇයගේ පළමු නිල කාල පරිච්ඡේදය තුළ ඔහු/ඇය විසින් ඉටු කරන ලද කාර්යයන් පිළිබඳව වාර්තාවක් ලබා දිය යුතුය.

V. සභාපතිවරයෙක් ද ඇතුලුව පාලක සභා සාමාජිකයන් තිදෙනෙකුගෙන් යුත් ඇගයීම් කමිටුවක් පාලක සභාව විසින් පත් කළ යුතුය. ඇගයීම් කමිටුවේ කිසිදු සාමාජිකයෙකු උපකුලපති තනතුර සඳහා අයදුම් කළ හෝ නම් කළ පුද්ගලයෙකු නොවිය යුතුය. එක් එක් අයදුම්කරුගේ සුදුසුකම්, වෘත්තීය පළපුරුද්ද සහ දැක්ම පිළිබඳ ප්‍රකාශයේ ඇගයීම, තෝරා පත් කර ගැනීම සිදු කිරීමට පෙර පාලක සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

VI. ඡන්දය විමසන දිනට අවම වශයෙන් දින 7කට ප්‍රථමව, ඉහත ඡේද අංක iii සහ/ හෝ iv සහ v ප්‍රකාරව අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද සියලුම ලේඛනවල පිටපත් සමඟ ඊළඟ උපකුලපතිවරයා තෝරා පත් කර ගැනීම සඳහා විශේෂ පාලක සභා රුස්වීමක් පැවැත්වීමේ නිවේදනය, සියලුම පාලක සභා සාමාජිකයන් සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත් කරන ලද නිරීක්ෂකයා වෙත නිසි පරිදි සංසරණය වූ බවට පාලක සභාවේ ලේකම්වරයා විසින් තහවුරු කළ යුතු වන්නේය.

කෙසේ වෙතත්, පාලක සභාවේ සාමාජිකයෙකු අපේක්ෂකයකු වන්නේ නම්, වෙනත් අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කරන ලද ලේඛන / ජීව දත්ත විස්තර එවැනි අයදුම්කරුවෙකු වෙත  සංසරණය නොවන බවට පාලක සභාවේ ලේකම්වරයා විසින් තහවුරු කළ යුතු වන්නේය.

VII. ඡන්දය පැවැත්වීමට මාස 3 කට ප්‍රථම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිරීක්ෂකයෙකු පත් කිරීම සඳහා ඉල්ලීමක්, පාලක සභාවේ ලේකම්වරයා විසින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

VIII. උපකුලපති තනතුර සඳහා සුදුසුකම් සපුරන ලද සියලු අපේක්ෂකයන්ට ඡන්ද විමසීම ආරම්භ කිරීමට ප්‍රථම, පාලක සභාව වෙත අවම වශයෙන් මිනිත්තු 15කට නොවැඩි මිනිත්තු 10 කට නොඅඩු කාල සීමාවකින් යුතු කෙටි ඉදිරිපත් කිරීමක් සඳහා ආරාධනා කරනු ලැබේ. කෙසේ වුව ද, කිසිදු අපේක්ෂකයෙකුට, එම අපේක්ෂකයා පාලක සභාවේ සාමාජිකයෙකු වුව ද, වෙනත් අපේක්ෂකයන්ගේ ඉදිරිපත් කිරීමක් සඳහා සහභාගී විය නොහැක. සුවිශේෂී වූ තත්වයක් තුළ දී, කිසියම් අයදුම්කරුවෙකුට / නාමිකයෙකුට විශේෂ පාලක සභා රැස්වීමට තම ඉදිරිපත් කිරීම සිදු කිරීමට නොහැකි නම්, ඔහුට/ඇයට "ස්කයිප්" වැනි වීඩියෝ සම්මන්ත්‍රණ හරහා එම ඉදිරිපත් කිරීම සිදු කිරීම සඳහා ඉඩ දෙනු ලැබේ.

IX. පාලක සභාව විසින් අපේක්ෂකයන් තිදෙනෙකු නම් කළ යුතු බැවින්, සුදුසුකම් ඇති සියලු අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් ඡන්ද පත්‍රිකාවක් පිළියෙල කළ යුතු අතර පාලක සභාව රහස් ඡන්දයකින් ඡන්දය ප්‍රකාශ කිරීම මඟින් අවසාන තීරණය ගනු ඇත. පාලක සභා සාමාජිකයෙකු අපේක්ෂකයෙකු වන්නේ නම් ඔහු/ඇය ඡන්දය ප්‍රකාශ කිරීමට හිමිකම් නොලබයි. ඡන්දය ප්‍රකාශ කරන අවස්ථාවේදී, සියලුම පාලක සභා සාමාජිකයින් එම අවස්ථාවට භෞතිකව සහභාගී වීම අනිවාර්ය වන අතර විශ්වවිද්‍යාලයක උපකුලපතිවරයා තෝරා පත් කර ගැනීම පිළිබඳව කිසිදු තොරතුරක් අනාවරණය කිරීමෙන් වැළකී සිටිය යුතු වේ.

X. ඡන්දය ප්‍රකාශ කරන අවස්ථාවේ දී, අපේක්ෂකයන් දෙදෙනෙකු හෝ වැඩි ගණනක් පළමු, දෙවන හෝ තෙවන ස්ථාන සඳහා සමාන ඡන්ද ප්‍රමාණයක් ලබා ඇත්නම් තවත් ඡන්ද විමසීමක් සඳහා පාලක සභාවට බලය ඇත්තේය. අනතුරුව සිදු කරන ඡන්ද විමසීම සමාන ඡන්ද ප්‍රමාණයක් ලබා ගත් අපේක්ෂකයන්ට සීමා විය යුතු අතර පෙර ඡන්ද විමසීමේ ප්‍රතිඵල නිවේදනය කළ වහාම එය සිදු කළ යුතුය. සෑම පසු ඡන්ද විමසීමක දී ම, පාලක සභාවේ සෑම සාමාජිකයෙකුටම එක් ඡන්දයක් පමණක් ප්‍රකාශයට පත් කිරීමට අවසර හිමි වන්නේය.

XI. ඉහත ඡේද අංක iii සහ/ හෝ iv හි සඳහන් ලිපි ලේඛන සමඟ වැඩිම ඡන්ද ගණනක් ලබා ගත් අපේක්ෂකයන් තිදෙනාගේ (03) නම් කොමිෂන් සභාව වෙත යොමු කළ යුතුය.

XII. ප්‍රචාරක දැන්වීම මඟින් අයදුම්පත් තුනක් (3) සොයා ගැනීමට නොහැකි වූ විට, ප්‍රචාරක දැන්වීම වඩා පුළුල් ලෙස පළ කරමින් ක්‍රියාවලිය අලුතින් ඇරඹිය යුතු වේ. මෙය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යොමු කිරීමට තිදෙනෙකු හඳුනා ගන්නා තෙක් නැවත නැවත සිදු කළ යුතු වේ.

04. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2018.08.01 දින සිට ක්‍රියාත්මක වන අතර, ඒ අනුව 2016.09.28 දිනැති කොමිෂන් සභා චක්‍රලේඛ අංක 14/2016 ට අනුව මෙතෙක් ගන්නා ලද ක්‍රියාමාර්ගවලට කිසිදු අගතියක් නොවන පරිදි ඉහත සඳහන් කරන ලද චක්‍රලේඛය 2018.08.01 දින සිට අහෝසි වේ.

05. කරුණාකර ඒ අනුව කටයුතු කරන්න.

අ.කළේ : මහාචාර්ය මොහාන් ද සිල්වා
සභාපති

පිටපත් :

1. ලේකම්/ උසස් අධ්‍යාපන සහ මහාමාර්ග අමාත්‍යාංශය
2. සභාපති කාර්යාලය/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. උප සභාපති/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයන්
5. ලේකම්/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල ලේඛකාධිකාරීවරුන්
8. ගණකාධිකාරී/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
9. විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන/ ආයතනවල පුස්තකාලයාධිපතිවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන්/ සහකාර පුස්තකාලයාධිපතිවරුන්

11. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය ලේඛකාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරීවරුන් / සහකාර ලේඛකාධිකාරීවරුන්

12. මණ්ඩප/ ආයතනවල නියෝජ්‍ය මූල්‍යාධිකාරීවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර මූල්‍යාධිකාරීවරුන් / සහකාර මූල්‍යාධිකාරීවරුන්

13.අභ්‍යන්තර විගණක/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

14. විශ්වවිද්‍යාලවල රජයේ විගණක අධිකාරීවරුන්

15.උසස් අධ්‍යාපන ආයතනවල නියෝජ්‍ය අභ්‍යන්තර විගණකවරුන්/ ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/සහකාර අභ්‍යන්තර විගණකවරුන්

16. වෘත්තීය සමිති ලේකම්වරුන්

17.විගණකාධිපති

ලිපි ගොනු අංක : යූජීසී/එච්ආර්/2/3/238